සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

# නර්තනය

**8 ශ්‍රේණිය** **කාලය පැය 2 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- සියළුම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.
- අංක 01 - 05 දක්වා වූ ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

01. ආධුනිකයකුට නම්‍යතා අභ්‍යාස ඉතා වැදගත් වන්නේ,

    (1) නර්තනයට අවශ්‍ය හැඩතල සකස්කර ගැනීමට.

    (2) ප්‍රාසාංගිකව නර්තනය කිරීමට.

    (3) උඩපැනීම හා කැරකීමට පහසුවීමට.

    (4) අත් හා පාද සකස් කරගැනීමට.

02. 7, 8, 9 යන පා සරඹයන්හි නාමයන් පිළිවෙලින් ඇති වරණය තෝරන්න.

    (1) කරනම්, නුහුරු, දෙපැති අඩිය (2) කරනම්, දගර, දෙපැති අඩිය

    (3) නුහුරු, කරණම්, දෙපැති අඩිය (4) නුහුරු, දෙපැති, කරණම් අඩිය

03. ''රුංතක ජිංතක තරිකිට කුංදත් තාග්ගජිංතක තරිකිට කුංදත් රුංතක ජිංතක තරිකිට කුංදත් තා.....'' මෙය,

    (1) හයවන ගොඩසරඹයේ කස්තිරමය. (2) පස්වන ගොඩසරඹයේ කස්තිරමය.

    (3) හතරවන ගොඩසරඹයේ කස්තිරමය. (4) තුන්වන ගොඩසරඹයේ කස්තිරමය.

04. ''භය'' නැමැති ස්ථායිභාවය වඩාත් උද්දීපනය කළහැකි සත්ත්ව චරිතයකි,

    (1) මොණරා (2) උකුස්සා (3) අලියා (4) සිංහයා

05. ''ජිංකඩතක ජිංකුකු තක'' මෙම අලංකාර බෙදරපදයෙහි තාලරූපය හා තිත වන්නේ,

    (1) මාත්‍රා 2 තාලරූපය හා සුළු තනිතිතය.

    (2) මාත්‍රා 3 තාලරූපය හා මැදුම් තනිතිතය.

    (3) මාත්‍රා 4 තාලරූපය හා මහ තනිතිතය.

    (4) මාත්‍රා 2+3 තාලරූපය හා සුළු මැදුම් දෙතිතය.

- **ප්‍රශ්න අංක 06 - 10 දක්වා ප්‍රශ්නවලට නොගැලපෙන වචනය තෝරන්න.**

06 (1) නුහුරු අඩිය (2) සිව් අඩිය (3) ඇල සරඹය (4) දෑල සරඹය

07 (1) හනුමා (2) තුරඟා (3) වෛරෝඩි (4) නෛයඩි

08 (1) ඇස් (2) ඇහිබැම (3) තොල් (4) දණහිස

09 (1) සමගුණ (2) දෙගුණ (3) තුන්ගුණ (4) සිව්ගුණ

10 (1) සිරසපාද (2) කුළු (3) පතුරු (4) සවරං

- **ප්‍රශ්න අංක 11 - 15 දක්වා වූ ප්‍රශ්න හරි නම් (✓) ද, වැරදි නම් (✗) ද යොදන්න.**

11 පහතරට බෙරයෙහි දිග තුන්වියත් තුනගුලකි. ( )

12 වන්නම් නර්තනයේදී අලංකාර පදයොදාගැනීම වඩාත් උචිතය. ( )

13 තත්, ජිත්, තොං, නං, මෙය කස්තිරමකි. ( )

14 පුටුව සරසලයි මම සැලකරන්නේ මෙය සිරසපාද කවියකි. ( )

15 දවුල් බෙරය විතතාතත ඝනයට අයත් වන්නකි. ( )

- **ප්‍රශ්න අංක 16 - 20 දක්වා 'අ' කොටසෙහි ඇති පදවලට ගැලපෙන පද කොටස් 'ආ' කොටසෙහි දක්වේ. නිවැරදිව ගලපා යා කරන්න.**

| | 'අ' | 'ආ' |
|---|---|---|
| 16 | දෙවොල්මඩුව | ආතත |
| 17 | එකැස්බෙරය | දෙගුණ |
| 18 | මධ්‍යලය | මාත්‍රා 2+3 තාලය |
| 19 | කුද ගජිත කුද තා | මාත්‍රා 3 තාලය |
| 20 | වෛරෝඩි | පහතරට |

**8 ශ්‍රේණිය** **නර්තනය - II කොටස**

- **පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**

01 ගායනයට මෙන්ම නර්තනයටද තාලය ඉතා අත්‍යවශ්‍ය වේ.

(i) දෙතිතේ ප්‍රභේද කීයද? ඒ මොනවා ද? (ල.03)

(ii) 'දොං දොං ජිං ජිං ගජිගත' මෙම බෙරපදය නිවැරදි තාලරූපයට ප්‍රස්ථාර කරන්න. (ල.03)

(iii) ''අගේ වඩන මගේ තාලම් හරඹ බලන්නේ

වගේ නොදන ඇයි නුඹලා කීමට එන්නේ''

ඉහත සඳහන් කවිපද දෙක මාත්‍රා 3 තාලරූපයට ප්‍රස්ථාර කරන්න. (ල.04)

02 වන්නම් පිළිබඳව ඉගෙන ගන්නා ශිෂ්‍යයා එහි අන්තර්ගතය පිළිබඳව සැළකිලිමත් විය යුතුයි.

(i) උඩරට වන්නමක ප්‍රධාන කොටස් කීයද? ඒවා නම් කරන්න.

(ii) තුරඟා වන්නමට අදාල කවියක් ලියන්න.

(iii) ''වන්නම්'' පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

03 ශ්‍රී ලාංකේය ගැමි ගායනා වලින් ගැමියාගේ ජීවන රටාව පෙන්නුම් කරයි.

(i) ගැමි නැටුම් වර්ග 04 ක් නම් කර එයට අදාල රංග උපකරණය නම් කරන්න.

(ii) වෘත්තීන් හා බැඳි ගැමි නැටුමකට අදාල කවියක් ලියන්න.

(iii) 'ගැමි නැටුම්' වල විශේෂ ලක්ෂණ හතරක් ලියන්න.

04 චරිත නිරූපන අවස්ථා නිරූපනය කිරීමේදී පරිසරය ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණ කළ යුතුයි.

(i) නර්තන නිර්මාණ සඳහා යොදාගත හැකි සත්ත්ව චරිත 04 ක් නම් කරන්න.

(ii) චරිත නිරූපණයේදී යොදා ගත හැකි වාද්‍ය භාණ්ඩ තුනක් නම් කරන්න.

(iii) ඔබ ඉදිරිපත්කළ චරිතයක සුවිශේෂී ලක්ෂණ දෙකක් ලියන්න.

05 පහත සඳහන් මාතෘකා වලින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) දණ්ඩි කඳ

(ii) ගොඩ සරඹ

(iii) දවුල

(iv) ගැමි නැටුම්

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | 1 | 06 | 1 | 11 | ✓ | 16 | පහතරට |
| 02 | 3 | 07 | 3 | 12 | ✓ | 17 | අතත |
| 03 | 2 | 08 | 4 | 13 | × | 18 | දෙගුණ |
| 04 | 4 | 09 | 3 | 14 | × | 19 | 2+3 තාලය |
| 05 | 2 | 10 | 1 | 15 | ✓ | 20 | මාත්‍රා 3 තාලය |

## II කොටස

01 (i) තුනකි.

සුළු මැදුම් දෙතිත (12, 123)
සුළු මහ දෙතිත (12, 1234)
මැදුම් මහ දෙතිත (123, 1234) (ල. 03)

(ii)

| / 1 | 2 | / 1 | 2 | 3 | 4 | 1 | 2 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දොං | - | දොං | - | ජිං | - | ජිං | - | ග | ජි | ග | ත |

(● තිත සඳහන් කර තිත් සංඥා යොදා තිබේනම් නිවැරදිව ප්‍රස්ථාර කර තිබීම.)

(iii)

| / 1 | 2 | 3 | / 1 | 2 | 3 | / 1 | 2 | 3 | / 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අ | ගේ | - | ව | ඩ | න | ම | ගෙ | තා | - | ලම් | - |
| හ | ර | ඹ | බ | ලන් | - | නේ | - | - | - | - | - |
| ව | ගේ | - | නො | දැ | න | ඇ | යි | නු | ඹ | ලා | - |
| කී | - | ම | ට | එන් | - | නේ | - | - | - | - | - |

(● තිත සඳහන් කර තිත් සංඥා යොදා තිබේනම් ල.02 යි, නිවැරදි ලෙස ප්‍රස්ථාර කර තිබේ නම් ල.02)

02 (i) හයයි (06) 1. බෙර පදය 2. තා නම 3. කවිය
4. කස්තිරම 5. සීරු මාරුව 6. අඩව්ව (ල.03)

(ii) තුරඟා වන්නමට අයත් කවි හතරෙන් ඕනෑම කවියක් ලියා තිබේනම්. (ල.03)

(iii)
- උඩරට / පහතරට / සබරගමු නර්තන සම්ප්‍රදායන් තුනේම වන්නම් ඇතිබව.
- මුල් යුගයේ ගායනය සඳහා පමණක් රචනා වී ඇති බව.
- උඩරට / සබරගමු විනෝදාස්වාදය අරමුණු කොට රචනා වී ඇති අතර පහතරට සිංදු වන්නම් දේව ඇදහිලි මුල්කරගෙන රචනා වී ඇති බව.
- වන්නම් අන්තර්ගතය,
උඩරට වන්නම් 18 ක් ද, පහතරට වන්නම් 32 ක් ද, සබරගමු වන්නම් 18 ක් ද.

03 (i) කුළු නැටුම - කුල්ල | ලී කෙළි - ලී
කලගෙඩි නැටුම - කලය | සවරං - සවරම
චාමර - චාමරය ආදී වශයෙන් ලියා ඇත්නම් (ල.03)

(ii) ගොයම්, පන්නෙළීම, කුළු ආදී වශයෙන් එක් කවියක් ලියා ඇත්නම් (ල.03)

(iii) 1. සරලයි 2. සාමූහික සහභාගිත්වය 3. සරල වෙස්ගැන්වීම
4. උපකරණ භාවිතය 5. සරල තාල ලක්ෂණ 6. ඇඳුම් පැලඳුම් වල චාම්බව (සරලබව)

04 (i) වඳුරා, සිංහයා, මොණරා, කොටියා ආදී වශයෙන් සත්ත්ව නාම 04 ක් ලියා ඇත්නම් (ල.03)

(ii) දේශීය වාද්‍ය භාණ්ඩ හෝ ආදේශ වාද්‍ය භාණ්ඩ තුනක් ලියා ඇත්නම් (ල.03)

(iii) සුවිශේෂී ලක්ෂණ දෙකක් ලියා ඇත්නම් (ල. 2 + 2 = 04)

05 අදාළ මාතෘකාවට කරුණු ගොනුකර ඇත්නම් ලකුණු ලබාදෙන්න.
කරුණු පහකට ලකුණු පහයි. (5 × 2 = 10)